සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

දෙවන වාර ඇගයීම - 2018
,உணவுலஹகவு ஜட_இண கஜபகவுகப்ல் - 2018
Second Term Evaluation - 2018

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: I | පැය / மணித்தியாலம் / Hours: 01 |

නම / நகஅஉஷ / Name ..............................................

සැලකිය යුතුයි

- සියලු ම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40ක් ලැබේ.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති ( 1) ( 2) (3 ) (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
- එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

❖ අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවලට එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

(01) දුටු දෙයින් පුදුමයට පත් වූ මම **තක්බීරිව** සිටගෙන සිටියෙමි.

(1) කනස්සල්ලෙන් යුතුව (2) සතුටින් (3) පුදුමයෙන් (4) බියෙන් ගල් ගැසී

(02) වංචනිකයන්ගේ ක්‍රියා කලාපය එළිදරව් වීමත් සමග ම එහි පරීක්ෂණ වාර්තා ගැන සියලු දෙනා **ඇහැ ගහගෙන** බලා සිටිති.

(1) දෑස් අයාගෙන (2) කම්පා වෙමින් (3) දැඩි සෝදිසියෙන් යුතුව
(4) ප්‍රචණ්ඩකාරී ලෙස

(03) ගංවතුර තර්ජනයට මුහුණ දුන් ප්‍රදේශවාසීන් විශාල පිරිසකට **උන්හිටි තැන්** අහිමි විය.

(1) දේපළ (2) වාසස්ථාන (3) නවාතැන් (4) වස්තුව

❖ 04 සිට 07 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

(04) කෙටිකතාව,.......... හෙවත් සිතින් මවා ගැනීමෙන් ගොඩනැගිය හැකි සාහිත්‍යාංගයකි.

(1) ස්මෘතිය (2) ධාරණය (3) කල්පිත (4) සිත්කලු

(05) දේශාභිමානී ගී ශ්‍රවණයෙන් රසිකයාගේ හදවතේ ඇති වන............ දේශය පිළිබඳ අභිමානය වඩවාලයි.

(1) අපූර්වත්වය (2) නවතාව (3) වින්දනය (4) ප්‍රතිභාව

(06) තම නිවාසයේ ක්‍රීඩකයාගේ විශිෂ්ට ජයග්‍රහණයෙන් ................ වූ සිසුහු ජයඝෝෂා නැගූහ.

(1) ඔකඳ (2) සුහද (3) දුමන (4) පුදුම

Remove Watermark Now

(07) සාර්ථක ජීවිතයක් ගත කිරීම සඳහා සාහිත්‍ය කෘති පරිශීලනයෙන් ලැබෙන ජීවිත.............. ඉතා වැදගත් වේ.

(1) පරීක්ෂණය (2) පරිසාධනය (3) පරිභාවිතය (4) පරිඥානය

(08) අකාරාදි පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) කුරුණෑගල, කතරගම, කෑරගල, කෝට්ටේ

(2) හම්බන්තොට, හලාවත, හන්දෙස්ස, හිනිදුම

(3) මෝදර, මුතියංගනය, මීතිරිගල, මිල්ලනිය

(4) පනාගොඩ, පාලගම, පැපිලියාන, පින්නවල

(09) තාලුජ, කණ්ඨජ, මූර්ධජ හා ඕෂ්ඨජ අක්ෂරයක් ඇතුළත් පේළිය තෝරන්න.

(1) ජ, ග, ඩ, ම (2) ශ, ක, ධ, ද

(3) ද, බ, ෂ, ග (4) ච, ත, ක, ණ

(10) ශ ෂ ස ෆ යන අක්ෂර අයත් වර්ගය නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) ඝෝෂ / ඌෂ්මාක්ෂර (2) ඝෝෂ අන්තඃස්ථානාක්ෂර

(3) අඝෝෂ / ඌෂ්මාක්ෂර (4) අඝෝෂ අන්තඃස්ථානාක්ෂර

(11) උක්ත නාම පද පමණක් යෙදී ඇති පිළිතුර තෝරන්න.

(1) මිනිසා, අශ්වයා, ළමයෙක්, කාන්තාවෝ (2) කතක්, රැජිනක, දරුවා, මිනිස්සු

(3) සොරා, නිළියක, අපි, ගුරුවරයා (4) මිනිසෙකු සතකු වෙළෙන්දකු සොරකු

(12) සිඳු තුළ නොසිට නැඟි මෙන් වළඹ ගිනි වැට

දිසි යළ පබළ කලඹෙව් ලෙළ තරඟ පිට

යන පද්‍ය පාදවල ඇතුළත් සඤ්ඤක අක්ෂර ගණන නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) 2 (2) 3 (3) 4 (4) 5

❖ 13 සිට 15 තෙක් ප්‍රශ්නවල අක්ෂර වින්‍යාසය වැරදි ලෙස යෙදුණු පිළිතුර තෝරන්න.

(13) (1) නටඹුන් (2) කැලණිය (3) මාලිගාව (4) කර්තෘ

(14) (1) පරිච්ඡේදය (2) විශිෂ්ට (3) පිළිඹිබු (4) පිළියෙල

(15) (1) වාචාර්ථ (2) සාමාර්ථ්‍යය (3) සූර්යයා (4) විස්මය

❖ 16 සිට 19 තෙක් ප්‍රශ්නවල මුලින් දී ඇති පදයට බහු අර්ථයක් නොදෙන පදය තෝරන්න.

(16) දද - (1) බමුණා (2) ලෝකය (3) කොඩිය (4) කුරුල්ලා

(17) කර - (1) බෙල්ල (2) පිහිය (3) හොඬවැල (4) කාලය

(18)

| | | | |
|---|---|---|---|
| අ. | සක්වා ලිහිණි | ක. | ගුණදාස අමරසේකර |
| ආ. | ආවර්ජනා | ග. | මහගමසේකර |
| ඇ. | නිර්මාණ පසුබිම | ච. | ආරියවංශ රණවීර |
| ඈ. | රන් රෝස | ජ. | ඒ.වී. සුරවීර |

නිවැරදිව ගැළපූ විට පිළිතුර වන්නේ,

(1) අ ජ (2) ආ ග (3) ඇ ක (4) ඈ ච

Remove Watermark Now

(19) 'ධර්මය දන්නා' යන්නට යෙදෙන තනි පදය තෝරන්න.

(1) ධාර්මික (2) ධර්මාන්විත (3) ධර්මධර (4) ධර්මානුකූල

(20 වැරදි ලෙස විසන්ධි කර ඇති පිළිතුර තෝරන්න.

(1) සත් + කාර්යය (2) තත් + භව (3) සත් + ගුණ (4) තද් + අනුබද්ධ

(21) නොගැළපෙන යුගල පදය ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) දුව පැන (2) කර කියා (3) ජරමර (4) තළාපෙළා

(22) **රූපාකෘති** යන පදයේ යෙදී ඇති පිල්ලම් නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) දීර්ඝ ඇදපිල්ල, ඉස්පිල්ල, කොම්බුව, ඇලපිල්ල

(2) දීර්ඝ පාපිල්ල, ඇලපිල්ල, ගැටපිල්ල, ඉස්පිල්ල

(3) දීර්ඝ ඇදපිල්ල, ඇලපිල්ල, ගැටපිල්ල, ඉස්පිල්ල

(4) දීර්ඝ පාපිල්ල, ගැටපිල්ල, ඇලපිල්ල, ඉස්පිල්ල

❖ අංක 23 සිට 24 තෙක් ප්‍රශ්නවල තද **කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන උත්තරය තෝරන්න.

(23) රචකයා යොදා ගත් භාෂාවේ **හසළත්වය** නිසා නිර්මාණයෙහි අගය වැඩි විය.

(1) නිපුණත්වය (2) සුභාවිතය (3) ව්‍යාංගාර්ථය (4) වාච්‍යාර්ථය

(24) සේනාධිරගේ සිතෙහි ඇතිවන ප්‍රහර්ෂය අවට පරිසරයේ විචිත්‍රත්වය වර්ණනා කිරීමෙන් **කුළු ගැන්වෙයි.**

(1) ඉෂ්ට වෙයි (2) මුදුන්පත් වෙයි (3) සාර්ථක වෙයි (4) සම්පූර්ණ වෙයි

(25) ගොවිතැන සමග **අත්‍යන්තයෙන්** ම බැඳුණු අනෙක් මහාර්ඝ නිර්මාණය නම් වැව යි.

(1) සත්‍ය වශයෙන් (2) එක් අන්තයකින් (3) අසීමිත ලෙස (4) ඉතා විශ්වාසදායී ලෙස

(26) අඹ, පුහුල්, ඉඟුරු, කොකිස් යනුවෙන් මොනරාගල වැසියන් ව්‍යවහාර කරන පදවල අර්ථ නිවැරදි ව ගැළපූ උත්තරය තෝරන්න.

(1) ගස්ලබු, වට්ටක්කා, ඉරිඟු, කිරිඅල

(2) පැපොල්, කිරි අල, ඉරිඟු, වට්ටක්කා

(3) ගස්ලබු, කිරිඅල, ඉරිඟු, වට්ටක්කා

(4) කිරි අල, ගස් ලබු, ඉරිඟු, පැපොල්

(27) පහත දී ඇති පද යුගල වල අර්ථය වරදවා දී ඇති පදයක් සහිත වරණය තෝරන්න.

(1) සොඬු - කම්මුල
නරමුල් - පැසුණු කෙස්

(2) කග - අසිපත
බරණින් - ආභරණවලින්

(3) රිදී වණින් - රිදී පාටින්
සබවස - සත්‍ය වචන

(4) උක්තීන් - කියමන්
පරිපෝෂිත - අනුන්ගෙන් පෝෂණය වන

Remove Watermark Now

❖ 28 සිට 30 තෙක් ප්‍රශ්නවල උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය නිවැරදිව දැක්වෙන උත්තරය තෝරන්න.

(28) ඕ තොමෝ පූජා භාණ්ඩ මිල දී.................

(1) ගත්තා ය (2) ගනු ලැබිණි (3) ගත්හ (4) ගනු ලැබුවා ය

(29) පාලකයෝ ........................ සමග සාකච්ඡාවක් පැවැත්වූහ.

(1) නිලධාරීන් (2) සේවකයෝ (3) නිලධාරිනියක් (4) කම්කරුවෝ

(30) සියලු ........................... නීතියට අවනත වීම යෙහෙකි.

(1) මනුෂ්‍යයෝ (2) මිනිසුන් (3) මිනිස්සු (4) පුරවැසියෝ

(31) ගොවීන් විසින් රට සරු .................

(1) කරති (2) කළහ (3) කරයි (4) කෙරේ

(32) ''අක්කර කාලෙන් කාලක් වත් නැති මිනිහෙකුට අක්කර පහක්.¡''

මෙහි ඇතුළත් **නොවන** විරාම ලකුණ කුමක් දැයි තෝරන්න.

(1) යුගල උඩු කොමා (2) හර්ෂාදි ලකුණ (3) නැවතීමේ ලකුණ (4) තනි උඩු කොමා

(33) සීයා හැඳින්වීමට 'මුත්තා' යන පදය යෙදෙන පළාත දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) ඌව පළාතේ ය (2) සබරගමු පළාතේ ය

(3) දකුණු පළාතේ ය (4) බස්නාහිර පළාතේ ය

(34) දී ඇති වචන ගොනු අතුරෙන් නොගැළපෙන පදයක් සහිත වරණය තෝරන්න.

(1) කෙත, උබර, කොඹර, ලියැද්ද

(2) ඇඹුල, කයිබත, වැදම, මුත්තෙට්ටුව

(3) මින්දද, අනඟ, මද, කුසුම්සර

(4) පටිමාඝර, පිළිමගේ, ප්‍රතිමා ගෘහ, චෛත්‍යඝර

(35) පහත දක්වා ඇති කවියේ හතරවන පදය දී ඇති වරණ අතුරෙන් තෝරන්න.

වලාකුළේ රන් පාටට විදුලි කොටනවා
ආකාසේ හඬ තළමින් අකුණු හඬනවා
බිංදු බිංදු මහ පොළවට වතුර වැටෙනවා
.............................................................

(1) අකුණු ගෙඩි ගිගුම් දී විදුලි ඉරි දුවනවා

(2) හෝ ගාමින් අපේ ගමට වැස්සක් එනවා

(3) කළු වලා කැලඹෙමින් මුදුන් වී නැගෙනවා

(4) ගල් ගහන්නා වගේ වතුර කැට වැටෙනවා

pastpapers.lk
pdfelement

(36) මෙහි අව්‍යය පද දෙකකට වඩා වැඩියෙන් යෙදුණු පිළිතුර තෝරන්න.

(1) සුසිරිත මිසක දුසිරිත කිසි තැනක නැත

(2) මාණික්‍ය සේ පොළෝ ගැබේ නිධාන වී

(3) රුසේ සියල්ලන්හට නව පණ පොවනා

(4) පර මල් පිදුවා දෝ පල දුන්නේ

(37) ඉරි ඇඳි පදවල ක්‍රියා වර්ගය නිවැරදි ව දක්වා ඇති පිළිතුර තෝරන්න.

1) ''ගලවපල්ලා මුගේ ලෝගුව''
2) ''බල්ලනේ ! තොපට සුභ උදෑසනක් වේවා''
3) ''ආපසු ආවොත් දරුවා දෙනවා කියලා හිතුවා''
4) ''මා ළඟට එනවා යුක්තිය ලබා ගන්න අත් දෙක වන වනා''

(1) විධි ක්‍රියා, ආශිර්වාද ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා

(2) විධි ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා

(3) විධි ක්‍රියා, ආශිර්වාද ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා

(4) මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා

(38) ''නිෂ්ඵල දෙයක් කිරීම '' යන්නට **නොගැළපෙන** ප්‍රස්තාව පිරුළ තෝරන්න.

(1) හිල් කුඩෙන් වතුර අදිනවා (2) දැලෙන් සුළං බඳිනවා

(3) අහසට ඉනිමං බඳිනවා (4) වක්කඩේ හකුරු හංගනවා

(39) පහත දැක්වෙන පද අතුරෙන් ධාතු ප්‍රකෘතියක් හා නාම ප්‍රකෘතියක් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) කයි, කප, නැටූ, සිංහ (2) කකා, ළමයා, පුටුව, බල

(3) අරම, ගම, සලකා, ගසා (4) අස, තබ, ක, කර

(40) නිවැරදි ව්‍යාකරණ විග්‍රහය දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) අප්‍රාණවාචී නාම පදවල බොහෝ විට ප්‍රකෘතිය ම බහු වචන රූපය ලෙස යෙදේ

(2) සකර්මක වාක්‍ය, කර්ම කාරක වාක්‍ය රටාවෙන් ලිවිය නොහැකි ය

(3)අතීත කාලය හැඟවීමට වර්තමාන ක්‍රියා රූපය ම ශුද්ධ ආඛ්‍යාතය ලෙස යෙදේ

(4) අර්ධ ස්වර ''ඍර්ෂ'' නමින් ද හැඳින්වේ

(ල: 01×40=40)

papers.lk pdfelement Remove Watermark Now